# රන්මසු උයනේ වාරි තාක්ෂණය පිළිබඳව අධ්‍යයනයක්

එල්.ඩී.ජී.ඩී. බණ්ඩාර

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

gayandleep06@gmail.com

**ප්‍රමුඛ පදඃ** රන්මසු උයන, වාරි තාක්ෂණය, පොකුණු, ජල කළමනාකරණය

## හැඳින්වීම

වැවක අතිරික්ත ජලය මුදාහල තවත් එක් ක්‍රමවේදයක් වූ උයන් හා පොකුණු නිර්මාණත්වයේ සමාරම්භක රජු ලෙස හඳුන්වා දෙන්නේ වසභ රජු ය. මෙ රජු විසින් නගර මධ්‍යයේ පොකුණු නිර්මාණය කරවා ඉන් නගරය අලංකාර කල ආකාරයත් නගර මධ්‍යයේ උයන් සහ ඒවායෙහි පොකුණු කරවා නගරයේ සිසිල පවත්වා ගෙන ආකාරය, විහාරාරාම ආශ්‍රිත ව පොකුණු කරවා එහි රැස්වෙන ජලය භික්ෂූන් වහන්සේලාගේ ප්‍රයෝජනයට ගැනීමට සැලැස්වූ ආකාරය, නගර අභ්‍යයන්තරයට ජලය රැස් කරවා නගර අලංකරණය සඳහා වතුර මල් භාවිත කළ බව, පොකුණු අලංකරණය සඳහා පස් පියුම් ද වර්ණවත් මත්ස්‍යයින් ද හංසයින් ද ඇති කල බව මහාවංසයේ සඳහන්ව ඇත.

## ක්‍රමවේදය

වැවේ සිට ඇළ මාර්ගවලටත් ඇළ මාර්ගවල සිට ක්‍රමානුකූල කාණු පද්ධතියක් ඔස්සේ හෝ උමං ජල මාතිකා ඔස්සේ පොකුණුවලටත් ජලය ලබා දුන් ආකාරය පිළිබඳව අවධානය යොමු කරන විට ඒ සඳහා භාවිත කළ වාරි ඉංජිනේරු තාක්ෂණික උපයෝගිතාව පිළිබඳව මෙහිදී අධ්‍යයනය කෙරේ. මේ සඳහා දත්ත ලබාගැනීමේ දී ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය උපයෝගී කරගන්නා ලදි.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

එදා සශ්‍රීක පුරයක් වූ රජරට ප්‍රභාවත් කළා වූ ඒ පොකුණු උයන් වතු අද නෂ්ටාවශේෂ බවට පත්ව තිබේ. කාලයේ වැලි තලාවෙන් වැසී ගිය ඒ පෞඪ ඉතිහාසයේ පැවැති ක්‍රමානුකූල නගර සැලසුම්කරණය හා වාරි සැපයුම් ක්‍රම වර්තමානයට ද උදාහරණ සපයයි. ඒ නිසාම ජල කළමනාකරණයටත් උයන් නිර්මාණයටත් අනුරාධපුර පිහිටි රන්මසු උයන ඉතාමත් වැදගත්වේ. IV වැනි මිහිඳු රජුගේ වෙස්සගිරි සෙල්ලිපියේ සඳහන් ආකාරයට මෙම උයනට ''රන්මසු උයන'' යන නාමය එක් වූ අයුරු පිළිබඳව සඳහන් ව ඇත. තවද මෙම උයන ''මඟුල් උයන'' ලෙස ද හඳුන්වයි. රන්මසු උයනේ අති විශිෂ්ට ජල සැපයුම් ක්‍රමයක් පැවති බව එහි පවතින නෂ්ටාවශේෂ පිරික්සීමේ දි පැහැදිලි වේ. උතුරෙන් මිරිසවැටි විහාරය ද, දකුණින් ඉසුරුමුණි විහාරයෙන් ද, බටහිරෙන් තිසාවැව් තාවල්ලෙන් ද, වට වී අති රන්මසු උයන අක්කර හතළිහක් පුරා පැවැතුණු සුවිශාල භූමි ප්‍රදේශයකි. අද නටබුන් ව ඇති මෙය අතීත රජ දවස සොබා සිරියෙන් ආඪ්‍යය වූ රමණීය පෙදෙසක් බව බැලූ බැල්මට පෙනීයයි. තිසා වැවේ ජල මට්ටමේ සිට අඩි තිහක් පමණ පහළින් මෙම උයනේ පොකුණ පිහිටුවා ඇත. මේ හේතුව නිසා සෘජු ඇළ මාර්ගයකින් පොකුණට ජලය ලබා ගත නොහැකි ය. එබැවින් තිසා වැවේ ජලය ප්‍රධාන සොරොව්ව හරහා ලබා ගෙන සොරොව්වෙන් ගලා යන

ජලය කාණු පද්ධතියක් ඔස්සේ පොකුණුවලට ගෙන යාමට සලස්වා ඇත. මේ සඳහා අඩි 2650 ක් පමණ දිගට ගඩොලින් නිමකළ කාණු පද්ධතියක් සකසා තිබේ.මෙහි ඇති තවත් විශේෂ ලක්ෂණයක් වන්නේ උයනේ පිහිටි පොකුණු එකිනෙක භූගතව සම්බන්ධ කර තිබීමයි. මෙහි ඇති එක් පොකුණක් හතරැස් ය. එහි පැත්තක දිග 21 කි. පොකුණෙහි පැති වටේම බදාම තට්ටු දෙකක් දමා ඇති අතර දෙපස පිහිටි පිය ගැට පෙළින් පහළට බැසිය හැකි ය. පිටතින් පැමිණෙන ජලය පොකුණට ගලා නොයන ලෙස ගල් තට්ටු දමා ඇත. අඩි 70 ක් පමණ දිග කාණුවක් පොළොව අභ්‍යයන්තරේ පිහිටා තිබේ. එහි පළල අඩි තුනකි. මෙම පොකුණේ අතිරික්ත ජලය එම කාණුව ඔස්සේ ගලා ගොස් තවත් පොකුණකට වැටේ. එහි ජලය උයනේ තිබූ විසිතුරු මල්ගොමුවලට භාවිතා කරන්නට ඇතැයි විද්වත් මතය වේ. මෙම පොකුණට බටහිර දෙසින් තවත් කුඩා පොකුණු කිහිපයක් වන අතර ඊට පිටින් 'ධාරා' ගෘහ නම් වූ ගොඩනැගිල්ලක් සහිත පොකුණකි. එහි දිග 24x4 පළල 12x3 කි. මේ පිළිබඳව පවතින මතය වන්නේ එය රාජකීයයන් ජල ක්‍රීඩා කල ස්ථානයක්ය යන්නයි. එනම් ධාරා ගෘහය ඇඳුම් මාරු කර ගැනීමට නිමවා ඇති බවත් පා ධෝවනයට වෙනම ස්ථානයකුත් පොකුණට බැසීමට පඩි පෙළකුත් සහිත මෙහි ජලය ලබා ගැනීමට මෙන්ම ජලය පිට කිරීමට ද කාණු පද්ධතියක් නිමවා ඇත. රන්මසු උයනේ ඇති තවත් විශේෂ නිර්මාණයක් වන්නේ දිය අගලකින් වට වූ ගොඩනැගිල්ලක නෂ්ටාවශේෂ වේ. ඇතැම් විට එය රජවරුන් නිදහස් සුවය විඳින්නට භාවිත කරන්නට ඇත. මෙම දිය අගල හා නෂ්ටාවශේෂ වූ ගොඩනැගිල්ල දෙස දුර සිට බලන විට ටප්මහලට යන පාර දෙපස ඇති අලංකාර ජල තාටාකවල ස්වරූපයක් ද මවාගත හැකි ය.මෙව න් පිහිටීමක් ඇති රන්මසු උයනේ ජල සැලසුම් ක්‍රමවේදය මිනිස් සිරුරේ ස්නායු පද්ධතියට සමාන බව එච්. සී. පී. බෙල් ගේ අදහසයි. විවිධ රජවරුන්ගේ පාලන කාලයන් තුළ විවිධ වෙනස්කම්වලට ලක්වෙමින් රන්මසු උයන සංවර්ධනය වී තිබේ.

## නිගමනය

තිසා වැවේ සිට කාණු පද්ධතියක් ඔස්සේ ලබා ගන්නා ජලය රන්මසු උයනේ පොකුණුවලටත් එම පොකුණුවල අතිරික්ත ජලය ඉසුරුමුණිය අවට කුඹුරු යායවලටත් ගලා යාමට සැලැස්වීම තුළින් නගර අලංකරණය සේම ආර්ථික සුරක්ෂිතභාවය ද රැකීමට අතීත හෙළ රජවරු ක්‍රමානුකූලව නගර සැළසුම් කරණය හා ජල සැපයුම් කරණය සිදු කොට ඇති බව රන්මසු උයන තුළින් පැහැදිලි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ


බස්නායක එච්. ටී. (1997)*පුරාණ ශ්‍රී ලංකාවේ ජල ශිෂ්ඨාචාරය*.කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

විතානාච්චි, සී. ආර්.(2017)*පුරාණ ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තය.* කොළඹ:පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

සෙනෙවිරත්න, ඒ. (2001)*පුරාණ සිංහල වාරි සංස්කෘතිය.* නුගේගොඩ: පියසිරි ප්‍රින්ටින් සිස්ටම්.